*සැ. යු.* — (i) 2014.04.17 දින පළ වූ අංක 1,859 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2011 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,860 - 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2014.04.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 624 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 627 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 629 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 16 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## ගම්පහ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක කාර්යාල සේවක සේවය 11 ශ්‍රේණිය | 01 | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා.ප.ච. 6/2006 (iv) PL-1-2006A අනුව වැටුප් පරිමාණයේ 12 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතුවේ. |
| 02 | පුස්තකාල සහයක කාර්යාල සේවක සේවය 11 ශ්‍රේණිය | 01 | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා.ප.ච. 6/2006 (iv) PL1-2006A අනුව වැටුප් පරිමාණයේ 12 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතුවේ. |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු කාර්යාල සේවක සේවය 111 ශ්‍රේණිය | 11 | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා.ප.ච. 6/2006 (iv) PL-1-2006A අනුව වැටුප් පරිමාණයේ 01 පියවර ආරම්භක වැටුප් පියවර වේ.) | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය /09 වසර සමත් වී තිබිය යුතුය. |
| 04. | රියදුරු රියදුරු සේවයේ 11 ආ | 01 | රු. 12,470 - 10 x130 - 10 x145 10 x 160 12 x 170 - රු. 18,860 (රා.ප.ච. 6/2006 (iv) PL3-2006A අනුව වැටුප් පරිමාණයේ 01 පියවර ආරම්භක වැටුප් පියවර වේ. | i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා./පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් 06ක් සමත්ව සම්මාන 02ක් ලබා තිබිය යුතුය. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්ව තිබිය යුතුයි.);<br>ii. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව හෝ ඊට වැඩි බර පන්තියක මෝටර් රථ පැදවීම පිළිබඳව මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය;<br>iii. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය;<br>iv. අවම වශයෙන් උස අඩි 05ක් විය යුතුය;<br>v. දිවා රාත්‍රී කාලවල සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය;<br>vi. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය;<br>vii. පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ සහ මාර්ග නීති පිළිබඳ පරීක්ෂණ වලින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු අතර ඉහලම ලකුණු ලබාගන්නා අයදුම්කරු බඳවා ගනු ලැබේ. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි ;
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය;
(iii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ තුනක් අවම වශයෙන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය;
(iv) ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඒ ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය;
(v) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.);
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය;
(vii) බඳවා ගැනීමේ පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට සහ රියදුරු තනතුර සඳහා ප්‍රායෝගික පරීක්‍ෂණයකට යොමුකර නියමිත අධ්‍යාපන සුදුසුකම් හා ලබාගන්නා ඉහළ ලකුණු මත සුදුස්සන් තෝරාගනු ලැබේ;
(ix) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන්, තනතුර සඳහා ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා තැන්තාවූ ද, සේවා කාලය තුළ හිමි සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ ද සතුටුදායා සේවා කාලයක් සපුරන ලද අයෙකු විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයන් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය;
(ii) බඳවාගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම්, එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ;
(iii) බඳවාගනු ලබන තනතුරෙහි අදාළ රාජකාරිවලට අනුකූලව ක්‍රියා කිරීමට ඔබ බැඳී සිටිය යුතු ය;
(iv) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කල යුතු ය;
(v) ඉහත දැක්වෙන බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුවේ නියෝග වලටද, බස්නාහිර පළාත් සභාවේ හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වරින් වර නිකුත් කරන රෙගුලාසිවලට හෝ නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාරව (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කර අයදුම්පත පැහැදිලිව සකස්කර 2014.05.09 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ගම්පහ ප්‍රාදේශීය සභාව, මිරිස්වත්ත" මුදුන්ගොඩ"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.);
(ii) අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "ඉල්ලුම්කරන තනතුර" සඳහන් කල යුතුය;
(iii) මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනිව සහ අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කෙරේ. තැපෑලේදී නැතිවුන අයදුම්පත්‍ර සම්බන්ධවද වගකීමට නොබැඳේ;

(iv) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. (මුල් පිටපත් සම්මුඛ පරීක්ෂයේ දී ඉදිරිපත් කළ යුතුය.)
  (i) උප්පැන්න සහතිකය;
  (ii) අධ්‍යාපන සහතික;
  (iii) පදිංචිය තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි විසින් නිකුත් කල සහතිකය;
  (iv) සේවා සුදුසුකම්, සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
  (v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
  (vi) හැඳුනුම්පතේ පිටපතක්;
  (v) රියදුරු බලපත්‍රයේ පිටපතක් (රියදුරු තනතුර සඳහා අයදුම්කරන්නේ නම්).

05. *නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.*

* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ගම්පහ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ප්‍රේමා සෙනෙවිරත්න,
ලේකම්,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

2013 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින,
හෙනරත්ගොඩ, මුදුන්ගොඩ,
ගම්පහ ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ ප්‍රාදේශීය සභාවේ ........................................... තනතුර සඳහා අයදුම්පත***

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
3. ස්ථිර ලිපිනය:————————.
4. දුරකථන අංකය:————————.
5. උපන් දිනය : වර්ෂය:————————. මාසය:————————. දිනය:————————.
   අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:——————. මාස:——————. දින:——————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
8. විවාහක/අවිවාහක තත්ත්වය :————————.
9. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? පරම්පරාවෙන් ද (නැතහොත් ලියාපදිංචි වීමෙන් ද) :————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා එවන්න) :
    *(අ)* සමත් වූ වසර/ශ්‍රේණිය :————————.
    *(ආ)* අ.පො.ස. (සා.පෙළ) විභාගය :

    (i) විභාග අංකය :————————. (ii) වර්ෂය :————————.

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. ඔබ දැනටමත් ගම්පහ ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්
    (i) දැනට දරන තනතුර :————————.
    (ii) එම තනතුරට පත්වූ දිනය :————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා) පදනම මත ද යනවග :————————.
12. වෘත්තීය සුදුසුකම් :————————.
13. සේවා පළපුරුද්ද :————————.
14. රියදුරු බලපත්‍රයේ වර්ෂය සහ අංකය (රියදුරු තනතුරු සඳහා පමණක් අදාළ වේ.) :————————.
15. අයදුම්කරුගේ උස (රියදුරු තනතුර සඳහා පමණක් අදාළ වේ.) :————————.
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? (ඔව්/නැත සඳහන් කරන්න.) :————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙම බඳවා ගැනීමෙහි කොන්දේසි අනුව මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයට නුසුදුස්සෙකු සේ සලකා, සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව ද මම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ................................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව යොදන්න).

දිනය :——————.

04-627

# පළාත් පාලන නිවේදන

## සංශෝධනය කිරීම

### ඇල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු ප්‍රතිශතය සංශෝධනය කිරීම

2013.11.29 වැනි දින අංක 1839 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ)කොටස පළාත් පාලන හි විවිධ දැන්වීම් යටතේ අංක 11-864-14 දරන දැන්වීමෙහි "8%ක වරිපනම් බද්දක් පනවා අය කිරීම "යන්න" 8% ක වරිපනම් බද්දක් 2014 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස සඳහා වන පළමු කාර්තුව සඳහා අය කිරීමටත්, 6%ක වරිපනම් බද්දක් 2014 වර්ෂයේ ඉතිරි කාර්තු තුන සඳහා පනවා අයකිරීමටත්"ලෙස සංශෝධනය විය යුතුය.

එච්. එම්. සුනිල් ගාමිණී,
සභාපති,
ඇල්ල ප්‍රාදේශීය සභාව,
කුඹල්වෙල, ඇල්ල.

2013 අප්‍රේල් මස 01 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

04-634

---

### මාතර මහ නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

මාතර මහ නගර සභාවේ සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරිය ප්‍රකාර 71(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම මහා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රංජිත් යාපා,
නාගරික කොමසාරිස්.

2013 මාර්තු මස 20 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

#### *උපලේඛනය*

| | *පළාත් පාලන ආයතනයේ නම* | *දිස්ත්‍රික්කය* | *වීථියේ වර්තමාන නම* | *අළුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තර* |
|---|---|---|---|---|---|
| 01 | මාතර මහ නගර සභාව | මාතර | උයන්වත්ත ධර්මරත්න මාවත, පළමුවන පටුමග | සිරිසේන රත්නප්පුලි මාවත | උයන්වත්ත ධර්මරත්න මාවතින් ආරම්භ වී ස්වර්ණ ජයන්ති මාවතේ අවසානය දක්වා |
| 02 | මාතර මහ නගර සභාව | මාතර | දැල්කඩ පාර | සී. ඒ. හරිස්චන්ද්‍ර මාවත | රාහුල පාරෙන් ආරම්භ වී කුමාරදාස මාවතින් අවසාන වේ. |
| 03 | මාතර මහ නගර සභාව | මාතර | උයන්වත්ත දකුණ, කන්දෙවත්ත පාර | වෛද්‍ය හේමවංශ අබේවික්‍රම සිරිවර්ධන මාවත | උයන්වත්ත පිලදුව පාරෙන් ආරම්භ වී වේරගම්පිට කන්දෙවත්ත පාරෙන් අවසන් වේ. |
| 04 | මාතර මහ නගර සභාව | මාතර | උයන්වත්ත දකුණ, ලුණු මෝල පාර | පූජ්‍ය කරගොඩ උයන්ගොඩ රතනජෝති නාහිමි මාවත | ආරම්භය- උයන්වත්ත ධර්මරත්න පාර අවසානය- පිලදුව පාර |

| | පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වීථියේ වර්තමාන නම | අළුතින් යොදා ඇති නම | මාර්ග විස්තර |
|---|---|---|---|---|---|
| 05. | මාතර මහ නගර සභාව | මාතර | පරමුල්ල පාර | කේ. කේ. ඩී. සිල්වා මාවත | ආරම්භය : කුමාරතුංග මාවත<br>අවසානය : තොටමුණ ජයමහා විහාර පාර |
| 06. | මාතර මහ නගර සභාව | මාතර | කොටුව මැද පාර | මොරකැටි ආරේ සුගුණතිස්ස නාහිමි මාවත | ආරම්භය : කොටුව විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත<br>අවසානය : කොටුව ධර්මාරාම පාර |
| 07. | මාතර මහ නගර සභාව | මාතර | වේරගම්පිට රජයේ නිල නිවාස පාර (කුප්පහිගේවත්ත) | ගජමන් නෝනා මාවත | ආරම්භය : ශ්‍රී ධර්මාරාම මාවත<br>අවසානය : රජයේ නිල නිවස |
| 08. | මාතර මහ නගර සභාව | මාතර | උයන්වත්ත ධර්මරත්න මාවත, 4 වන පටුමග | එස්. එල්. ප්‍රනාන්දු මාවත | ආරම්භය : උයන්වත්ත ධර්මරත්න මාවත<br>අවසානය : එම මාර්ගයේ නිවාස |
| 09. | මාතර මහ නගර සභාව | මාතර | පන්නිලගෙවත්ත මාවත | සමාධි පෙදෙස | ආරම්භය : ගාල්ල මාතර ප්‍රධාන පාර<br>අවසානය : එම මාර්ගයේ නිවාස |
| 10. | මාතර මහ නගර සභාව | මාතර | පිස්සිගෙවත්ත පාර (නම් කරන ලද පාරක් නොවේ) | සුහද මාවත | ආරම්භය : ජයමහා විහාර පාර<br>අවසානය : පරමුල්ල පාර |
| 11. | මාතර මහ නගර සභාව | මාතර | දුම්රිය පොළ පිවිසුම් පාර (නම් කරනලද පාරක් නොවේ) | ඒ. සී. එම්. අකිල් මාවත | මාතර - ප්‍රධාන දුම්රියපොළ අසලින් ආරම්භ වී බතුතා පාර දක්වා |

04-631

---

### වැලිගම ප්‍රාදේශීය සභාව

වැලිගම ප්‍රාදේශීය සභාව මගින් 2013.06.14 දින අංක 1815 IV(ආ) වැනි කොටස පළාත් පාලනය - *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දියු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා වරිපනම් ප්‍රදේශය දීර්ඝ කිරීම අදාළව පළ කරන ලද දැන්වීම අවලංගු කර නැවත 2014.04.07 වැනි දින වැලිගම ප්‍රාදේශීය සභා මාසික රැස්වීමට ඉදිරිපත් කර තීරණ අංක 4:13 යටතේ ඒකමතිකව සභා සම්මත විය. එය පහත සඳහන් පරිදි පළ කර ප්‍රකාශයට පත් කරමි.

වැලිගම ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා වරිපනම් ප්‍රදේශය දීර්ඝ කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් 2012.10.25 දින වැලිගම ප්‍රාදේශීය සභාවේ මාසික සභා වාර්තාවේ යෝජනා අංක 06.01.03 පරිදි පහත සඳහන් ප්‍රදේශ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(01) යටතේ දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කිරීම පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අංක මාර/සංස 2/බදු හා බල/ වැ.ප්‍රා.හා 2013.02.08 දින ලිපිය පරිදි ප්‍රකාශයට පත් කිරීම අනුමත කර ඇති බැව් සියලු දෙනාගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. මාතර-ගාල්ල ප්‍රධාන මාර්ගයේ මාතර නගර සභා සීමාවේ සිට (කඹුරුගමුව B & Q ආයතනය) ගොවියාපාන පාලම දක්වා වැලිගම නගර සභා සීමාව හැර (පැලෑන Bay Resoart සිට කුඹල්ගම Baberian හෝටලය දක්වා) ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය තුළ එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 1km බැගින් වූ ප්‍රදේශය.
2. වැලිගම කොක්මාදුව හරහා ඉමදුව මාර්ගයේ වැලිගම නගර සභා සීමාවේ සිට (රාධා රෙන්ටර්ස් ආයතනය) කනංකේ හන්දිය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.
3. කඹුරුගමුව කොටවිල මාර්ගයේ 1km ක් ගිය තැන් සිට (මැදගොඩ රෝහල) ලැබීම රෝහල දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.
4. පොල් අතුමෝදර දෙනිපිටිය මාර්ගයේ 1km ක් ගිය තැන් සිට (එලුවාවල හන්දිය) දෙනිපිටිය හන්දිය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.
5. මිදිගම පාතේගම මාර්ගයේ 1km ක් ගිය තැන් සිට ඉබ්බාවල හන්දිය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.
6. වැලිගම අකුරැස්ස මාර්ගයේ කඩේවත්ත පාලමේ සිට නාපේ හන්දිය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.
7. දෙනිපිටිය කොලේදන්ඩ මාර්ගයේ දෙනිපිටිය හන්දියේ සිට කොලේදන්ඩ හන්දිය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.

8. හල්ලල පාරේ හල්ලල හන්දියේ සිට උඩුකාව හන්දිය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍යය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.

9. කනංකේ අකුරැස්ස පාරේ ප්‍රාදේශීය සභා සීමාවේ සිට නිමලව ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලකෂ්‍යය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.

10. වැලිගම මුදුගමුව මාර්ගයේ වැලිගම නගර සභා සීමාවේ සිට (ආදාහනාගාරය) බොරාල වැව දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍යය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.

11. මුදුගමුව ජඹුරේගොඩ මාර්ගයේ ජඹුරේගොඩ හන්දියේ සිට දූවේ පන්සල දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍යය කරගෙන 200m බැගින් වූ ප්‍රදේශය.

12. හේන්වල කොටවිල පාරේ හේන්වල හන්දියේ සිට 7Km කණුව දක්වා එම මාර්ගයේ දෙපස පිහිටි සියලු දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍යය කරගෙන 1Km බැගින් වූ ප්‍රදේශය.

මීට අමතරව දැනට වරිපනම් අය කරන ප්‍රදේශයන් ද ඇතුළත් වේ.

පුෂ්ප කුමාර බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

04-773

# විවිධ දැන්වීම්

## බණ්ඩාරවෙල මහ නගර සභාව

### ජල සැපයුම් ගාස්තු අය කිරීම

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, 1989.01.20 වැනි දින අංක 541/17 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබුවා වූ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මාලාව ඉහත කී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් ද පිළිගන්නා ලදුව එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මාලාවේ IX වැනි කොටසේ 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු එකී අතුරු ව්‍යවස්ථාවේ (II) වගන්තිය අනුව 2013.07.19 දින දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබූ සංශෝධිත ගාස්තුවලට අමතරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ජල සැපයුම් ලබා ගැනීමේ දී ජල පාරිභෝගිකයින් වෙතින් මහ නගර සභා මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් රු. 8,000ක් වූ අමතර ගාස්තු මුදලක් හා එකී මාර්ග පළුදු කරන ලද කොටස් නැවත අළුත්වැඩියා කිරීම පිණිස වැයවන ඇස්තමේන්තු මුදල 2013.12.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අය කිරීම සුදුසු බවට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 දෙසැම්බර් මස 30 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

04-607/1

## බණ්ඩාරවෙල මහ නගර සභාව

### මහ නගර සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම

බණ්ඩාරවෙල මහ නගර සභාව සතු "බැකෝ යන්ත්‍රය" හා "ගල් රෝල" විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා බැහැර දීම වෙනුවෙන් එම යන්ත්‍රෝපකරණ කුලියට ගන්නා අයවලුන් වෙතින් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2014.01.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගාස්තු අය කිරීම සුදුසු බවට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කරන ලද බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**උපලේඛනය**

| *යන්ත්‍රය* | *කාලය* | *ගාස්තුව රු. ශ.* |
|---|---|---|
| බැකෝ යන්ත්‍රය (ඉන්ධන සහිතව NBT + VAT) | පැයකට | 2,200.00 |
| ටොන් 8 මාර්ග තලනය සඳහා (ගල් රෝල) (ඉන්ධන හා ප්‍රවාහනය හැර (NBT + VAT) | දිනකට (උපරිමය පැය 8) | 10,000.00 |

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2014 ජනවාරි මස 30 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

04-607/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.